**PDHS/CHEM/2026**

# මහියංගණ මූලික රෝහල වෙත
# පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම
# සඳහා මිළ ගණන් කැඳවීමේ - ලංසු ලියවිලි

**වෙළඳපොල මිළ සැඳහුම් ක්‍රමය/මිළ ගණන් කැඳවීම**

**ප්‍රසම්පාදන අංකය - PDHS/CHEM/2026**


**ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**
**අංක 301,**
**ආර්.එච්. ගුණවර්ධන මාවත, බදුල්ල.**

**දුරකතන අංකය - 055-2231981**
**ෆැක්ස් අංකය - 055-22230**
**වෙබ් ලිපිනය - https://healthdept.up.gov.lk**

වෙළඳපොල මිළ සැදහුම් ක්‍රමය/මිළ ගණන් කැඳවීම

මහියංගණ මූලික රෝහල වෙත පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම - ප්‍රසම්පාදන අංකය - **PDHS/CHEM/2026**

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මහියංගණ මූලික රෝහල වෙත ඉදිරි මාස **05** කාලය සඳහා පිරිසිදු කිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය වන රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා **2026** වර්ෂය සඳහා ඌව පළාත් ප්‍රධාන ලේකම් කාර්යලයෙහි ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්/ අදාළ සේවා සපයනු ලබන ආයතන වෙතින් පහත සඳහන් පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම සඳහා මුද්‍ර තැබූ මිළ ගණන් මෙයින් කැඳවනු ලැබේ.

| අනු අංකය | අවශ්‍ය රසායනික ද්‍රව්‍ය නාමය | ඒකකය | අවශ්‍ය ප්‍රමාණය | ඒකක මිල රු: | මුළු වටිනාකම (VAT රහිත) රු: |
|---|---|---|---|---|---|
| **1** | | | | | |

ඇමුණුම් ලිපි අංක **01** හි අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා උපකරණ විස්තර දක්වා ඇත. ඇමුණුම් ලිපි අංක **02** මගින් අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා උපකරණවල පිරිවිතර අවශ්‍යතා දක්වා ඇත.

**02.** සුදුසුකම් : ලංසුකරුවන් **2026** කාර්යාලීය සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම සඳහා ඌව පළාත් ප්‍රධාන ලේකම් කාර්යලයෙහි **2026** වර්ෂය සඳහා ලියාපදිංචි වූ/ අදාළ සේවාවන් සපයනු ලබන වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් සහිත සැපයුම්කරුවෙකු හෝ ආයතනයක් විය යුතුය.

**03.** ලංසු ලියවිලි ලබා ගැනීම.: 2026.07.07 දින සිට 2026.07.20 දින ප.ව. **3.00** දක්වා මෙම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන **healthdept.up.gov.lk** වෙත පිවිස, Downloads, Procurement Notice වෙත පිවිසීමෙන් බාගත කර ගත හැකිය.

**04.** ලංසු භාර දීම : නිසි පරිදි සම්පූර්ණ කර, ඔබගේ මිල ගණන් ලිපි කවරයක බහා වම්පස ඉහල කෙලවරේ "මහියංගණ මූලික රෝහල වෙත පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් **- 2026** " යනුවෙන් සඳහන් කර 2026.07.21 දින පෙ.ව.10.30 ට පෙර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, අංක **301,** ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ

මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලන මෙන් කාරුණිකව දන්වා සිටිමි. (සම්පූර්ණ කළ ඇමුණුම් අංක **01-05** දක්වා වූ ආකෘති හා ඉල්ලා ඇති අනෙකුත් ලේඛන ද මේ සමග එවිය යුතුය)

**05.** ලංසු ඇපය : මේ සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව නිකුත් කර ඇති ප්‍රසම්පාදන අත්පොත **- 2024** හි **5.9 (ඉ)** ඡේදයට අදාළව ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. එකී ප්‍රකාශය ලබා දිය යුතු ආකෘතිය ඇමුණුම් අංක **05** ලෙස ලංසු ලියවිලිවල අමුණා ඇත.

**06.** ලංසු විවෘත කිරීම : නියමිත දින නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් විවෘත කිරිම 2026.07.21 දින පෙ.ව 11.00 ට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේදී සිදු කරනු ලැබේ. ඒ සඳහා ලංසු ඉදිරිපත් කළ පුද්ගලයන්ට හෝ ලංසු ඉදිරිපත් කළ ආයතනයන්හි ලිඛිතව බලයලත් නියෝජිතයන්හට තම අනන්‍යතාව සනාථ කර සහභාගී විය හැකිය.

**07.** මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් කිසිදු හේතුවක් නොදන්වා සියලුම ලංසු හෝ ඉන් කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

විශේෂඥ වෛද්‍ය ඩබ්.ආර්.එම්. මහේන්ද්‍ර සෙනෙවිරත්න.
ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

**කොන්දේසි හා නියමයන්**

මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාළ පහත සඳහන් කොන්දේසි හා නියමයන් පිළිබඳව ලංසුකරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

i. ලංසු ඉදිරිපත් කරන පුද්ගලයා හෝ ආයතනය අසාධුගත නොවූ සේවා සපයන ආයතනයක් විය යුතුය.

ii. මෙකී ලංසු යෝජනා, ලංසු විවෘත කළ දින සිට දින 49ක කාලයක් වලංගු වන අතර, ඒ අනුව ලංසු සුරක්ෂණ ප්‍රකාශය ලංසු විවෘත කළ දින සිට දින 28ක කාලයක් වලංගුව පවතී.

iii. මේ සමග ඉදිරිපත් කරන ඇමුණුම I හා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 හි 1.5 හි, (ඇ) වගන්තියට අදාළව ලංසුකරුවන් විසින් ලබා දිය යුතු අනිවාර්යය ප්‍රකාශය සඳහා වන ආකෘතිය " දූස්සන්ධානීය නොවන බවට වන දිවුරුම් ප්‍රකාශය" මැයෙන් යුතු ප්‍රකාශය සෑම ලංසුකරුවෙකු විසින්ම සම්පූර්ණ කර, ලංසුව සමග භාර දිය යුතුය.

iv. ඉදිරිපත් කරන ලද මිල ගණන් ලංසු විවෘත කළ දින සිට 2026.12.31 දින දක්වා වලංගු විය යුතුය. මිළ දී ගන්නා භාණ්ඩ තබා ගැනීම සඳහා මහියංගණ මූලික රෝහලෙහි පවතින ඉඩ-කඩ අනුව මාසිකව හෝ කාර්තුමය වශයෙන් ඇණවුම් කළ භාණ්ඩ ලබා දෙන ලෙස තොරාගනු ලබන ලංසුකරු වෙත දන්වා සිටියහොත් ලංසුකරු ඒ අනුව කටයුතු කළ යුතුය.

v. ඉල්ලා ඇති පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් මහියංගණ මූලික රෝහලට ප්‍රවාහනය කොට භාර දිය යුතුය. එම භාණ්ඩ නිසි පරිදි ලැබී ඇති බව හා නියමිත ලේඛනවලට ඇතුළත් කර ඇති බව රෝහල් පාලනාධිකාරියෙන් සනාථ කළ පසු ගෙවීම් බිල්පත් නිරවුල් කිරීමට කටයුතු කෙරේ.

vi. අදාළ රසායනික ද්‍රව්‍ය සඳහා SLS සහතිකය හෝ NMRA සහතිකය ලබා තිබිය යුතුය. එසේ නොමැතිනම් ITI (Industrial Technology Institute ) ආයතනය මගින් නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කළ යුතුය.

vii. සාම්පල (Samples): ඇගයීම් කටයුතු සඳහා ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක එක් එක් අයිතමයේ නියැදියක් (Sample) නොමිලේ ලබා දීමට ලංසුකරු බැඳී සිටිය යුතුය.

viii. ඇසුරුම්කරණය: සියලුම රසායනික ද්‍රව්‍ය කාන්දු නොවන ලෙස ආරක්ෂිතව, අඩංගු ද්‍රව්‍යයේ නම සහ කල් ඉකුත්වන දිනය පැහැදිලිව සඳහන් කර (Properly labeled) ඇසුරුම් කර තිබිය යුතුය.

ix. මේ සඳහා ඉදිරිපත් කර ඇති ආකෘතිය මඟින් පමණක් මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය.

x. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී කරනු ලබන සියලු වෙනස් කිරීම් වලට හා මැකීම් වලට ටෙන්ඩර්කරු විසින් සිය කෙටි අත්සන යොදා තහවුරු කල යුතුයි.

xi. සියලුම ටෙන්ඩර් ටෙන්ඩර්කරු විසින් සිය අත්සන හා රබර් මුද්‍රාව යොදා සනාථ කළ යුතුය.

xii. ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයකින් කොටසක් හෝ පමණක් පිළිගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

xiii. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී පැන නගින සියලුම ආරවුල් 1995 අංක 11 දරන බේරුම් කිරීම් පනතේ සියලු විධිවිධාන හා එහි සංශෝධනයන්ට යටත්ව සිදු කරනු ලැබේ.

xiv. ඔබගේ ටෙන්ඩරය පිළිගෙන ඇණවුමක් ඔබ වෙත කරනු ලැබුවහොත් සති දෙකක් ඇතුලත ඇණවුම් කරන භාණ්ඩ ප්‍රමාණය ගෙනවිත් භාර දිය යුතුය.

xv. ඔබ වෙත මිල ගණන් කැඳවනු ලැබූ අවස්ථාවල මිල ගණන් ඉදිරිපත් කරනු නොලැබුනහොත් හෝ ටෙන්ඩරය පිරිනමා ඇති අවස්ථාවකදී අදාල කාලසීමාව තුළදී භාණ්ඩය ලබා දීමට අපොහොසත් වුවහොත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන අත්පොත - 2024 හි විධිවාධාන අනුව හා ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කරනු ලැබේ.

xvi. ලංසුකරුවන් දූස්සන්ධානීය නොවන බවට වන මේ සමග ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශය, සම්පූර්ණ කොට ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය. (ඇමුණුම 04)

<u>මිල ගණන් ඉදිරිපත් කිරිමේ ලංසු ආකෘතිය</u>

**ඇමුණුම 01**

රසායනික ද්‍රව්‍ය හා අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍යන් -
මූලික රෝහල, මහියංගණය **2026**

| අනු අංකය | අවශ්‍ය රසායනික ද්‍රව්‍ය නාමය | ඒකකය | අවශ්‍යතාවය | ඒකක මිල රු: | වටිනාකම රු: |
|---|---|---|---|---|---|
| **1** | ටීපොල් | ලීටර් | 3000 | | |
| **2** | ෆිනෝල් | ලීටර් | 3000 | | |
| **3** | HCL | ලීටර් | 750 | | |
| **4** | විම් | කි.ග්‍රෑ. | 375 | | |
| **5** | ටොයිලට් බෝල් ක්ලිනර් | ලීටර් | 375 | | |
| **6** | සුවඳ දියර | ලීටර් | 500 | | |
| **7** | බ්ලිචින් පවුඩර් | කි.ග්‍රෑ. | 350 | | |
| **8** | ග්ලාස් ක්ලිනර් | ලීටර් | 175 | | |
| **9** | ටයිල් ක්ලිනර් | ලීටර් | 250 | | |
| **10** | මැසි බෙහෙත් | ලීටර් | 100 | | |
| **11** | TCL | කි.ග්‍රෑ. | **275** | | |
| **12** | රතු පොලිස් | ලීටර් | 150 | | |
| **13** | වැක්ස් | කි.ග්‍රෑ. | **25** | | |
| **14** | ටිනර් | ලීටර් | 75 | | |
| **15** | ටර්පන් ටයින් | ලීටර් | **150** | | |
| **16** | පෙට්‍රල් | ලීටර් | **325** | | |
| **17** | ඉදල් | ඒකක | **350** | | |
| **18** | කොසු | ඒකක | **500** | | |
| **19** | මොප් | ඒකක | **500** | | |
| **20** | වයිපර් | ඒකක | **500** | | |
| **21** | කොමඩ් බ්‍රෂ් | ඒකක | **375** | | |
| **22** | සින්ක් බ්‍රෂ් | ඒකක | **325** | | |
| **23** | ඩෙග් බ්‍රෂ් | ඒකක | **500** | | |
| **24** | ඩස්ටර් | ඒකක | **250** | | |
| **25** | හෙවි ඩියුටි ග්ලවුස් | ඒකක | **500** | | |
| **26** | කළු ලොකු කවර (Garbage) | ඒකක | **40000** | | |
| **27** | කළු පොඩි කවර | ඒකක | **35000** | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 28 | කහ ලොකු කවර | ඒකක | 50000 | | |
| 29 | කහ පොඩි කවර | ඒකක | 35000 | | |
| එකතුව | | | | | |
| වට්ටම් ලබා දෙන්නේනම් එම වටිනාකම | | | | | |
| එකතුව | | | | | |
| භාණ්ඩ හා සේවා බද්ද (Vat) | | | | | |
| මුළු වටිනාකම (බදු සහිත) | | | | | |
| මුළු වටිනාකම (බදු රහිත) | | | | | |

ලංසුකරුගේ නම :-.......................................................

ලංසුකරුගේ අත්සන :-.......................................................

ලිපිනය :-.......................................................

දිනය :-.......................................................

## 1. පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය (Cleaning Chemicals)

| අ/අ | අයිතමය | සම්මත තාක්ෂණික පිරිවිතර (Standard Specifications) | ලංසුකරුගේ එකඟතාවය (Yes/No) | ලංසුකරුගේ අදහස් |
|---|---|---|---|---|
| 1 | ටීපොල් (Teepol) | • බහුකාර්ය පිරිසිදුකාරක දියරයක් (General purpose liquid detergent) විය යුතුය.<br>• pH අගය 6.5 - 7.5 අතර (සමට හානි නොවන).<br>• SLS 1391 හෝ ඊට සමාන ප්‍රමිතියකින් යුක්ත විය යුතුය. | | |
| 2 | පිනෝල් (Phenol/Phenyl) | • පයින් (Pine) සුවඳින් යුත් බැක්ටීරියා නාශක (Disinfectant) දියරයක් විය යුතුය.<br>• රෝහල් සහ පොදු ස්ථාන භාවිතයට සුදුසු, ජලයේ පහසුවෙන් දියවන තත්ත්වයේ විය යුතුය. | | |
| 3 | HCL (Hydrochloric Acid) | • පිරිසිදු කිරීමේ කටයුතු සඳහා සුදුසු කාර්මික මට්ටමේ (Industrial grade) අම්ලයක් විය යුතුය.<br>• සාන්ද්‍රණය 10% - 15% අතර විය යුතුය. | | |
| 4 | විම් (Scouring Powder) | • ග්‍රීස් සහ දැඩි පැල්ලම් ඉවත් කළ හැකි රළු පිරිසිදුකාරක කුඩු (Abrasive powder) වර්ගයක් විය යුතුය.<br>• ලෝහ හෝ පිඟන් භාණ්ඩවලට හානි නොවන ප්‍රමිතිය. | | |
| 5 | ටොයිලට් බෝල් ක්ලීනර් | • SLS 554 ප්‍රමිතියට අනුකූල විය යුතුය.<br>• මතුපිට රැඳෙන ඝන/උකු (Viscous) දියරයක් විය යුතු අතර, ඛනිජ සහ මලකඩ බැඳීම් ඉවත් කිරීමට සමත් විය යුතුය. | | |
| 6 | සුවඳ දියර (Air Freshener) | • පරිසරයට හෝ ශ්වසනයට හානිකර නොවන (Non-toxic) ජලය පදනම් කරගත් දියරයක් විය යුතුය.<br>• දිගු වේලාවක් සුවඳ රැඳෙන ප්‍රසන්න සුවඳකින් යුක්ත විය යුතුය. | | |
| 7 | බ්ලීචිං පවුඩර් | • SLS 557 ප්‍රමිතියට අනුකූල විය යුතුය.<br>• සැපයුම භාරදෙන අවස්ථාවේදී අවම වශයෙන් 33% ක සක්‍රීය ක්ලෝරීන් (Active Chlorine) ප්‍රතිශතයක් තිබිය යුතුය. | | |
| 8 | ග්ලාස් ක්ලීනර් | • වීදුරු මතුපිට පැල්ලම් රහිතව (Streak-free) පිරිසිදු කරන, ඉක්මනින් වාෂ්ප වන දියරයක් විය යුතුය.<br>• ඇමෝනියා හෝ මධ්‍යසාර (Alcohol) පදනම් කරගත් සූත්‍රයක් විය යුතුය. | | |
| 9 | ටයිල් ක්ලීනර් | • සෙරමික් සහ ටයිල් මතුපිටට හෝ එහි බදාමවලට හානි නොකරන (Non-corrosive) විශේෂිත පිරිසිදුකාරක දියරයක්. | | |
| 10 | මැසි බෙහෙත් (Insecticide) | • කෘමිනාශක රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලත් නිෂ්පාදනයක් විය යුතුය.<br>• මිනිස් සෞඛ්‍යයට අවදානමක් නොමැති, | | |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රමිතියෙන් යුත් දියරයක් විය යුතුය. | | |
| **11** | **TCL** | • රෝහල් සහ පොදු අපජල පිරිසිදු කිරීමට සුදුසු ක්ලෝරිනීකෘත හුණු (Chlorinated Lime).<br>• අවම වශයෙන් 30% ක ක්ලෝරීන් අඩංගු විය යුතුය. | | |

**2.** ද්‍රාවක සහ ඔපදැමීමේ ද්‍රව්‍ය **(Solvents & Polishes)**

| අ/අ | අයිතමය | සම්මත තාක්ෂණික පිරිවිතර **(Standard Specifications)** | ලංසුකරුගේ එකඟතාවය **(Yes/No)** | ලංසුකරුගේ අදහස් |
|---|---|---|---|---|
| **12** | රතු පොලිෂ් **(Red Polish)** | • සිමෙන්ති/ටයිල් පොළොව ඔපදැමීම සඳහා සුදුසු ඉටි (Wax) අඩංගු උසස් තත්ත්වයේ නිෂ්පාදනයක්.<br>• ඉක්මනින් වියළෙන සහ දිලිසෙන ස්වභාවයක් ලබා දිය යුතුය. | | |
| **13** | වැක්ස් **(Floor Wax)** | • බිම ඔපදැමීම සඳහා වන කාර්මික මට්ටමේ (Commercial grade) දියර හෝ ඝන වැක්ස්.<br>• ලිස්සා යාම අවම කරන (Anti-slip) ගුණාංග සහිත විය යුතුය. | | |
| **14** | තිනර් **(Thinner)** | • තීන්ත දියාරු කිරීම සහ පිරිසිදු කිරීම සඳහා සුදුසු කාර්මික මට්ටමේ (Industrial grade) තිනර්. | | |
| **15** | ටර්පන්ටයින් **(Turpentine)** | • උසස් තත්ත්වයේ ඛනිජ ටර්පන්ටයින් (Mineral Turpentine). අපද්‍රව්‍යවලින් තොර පැහැදිලි දියරයක් විය යුතුය. | | |
| **16** | පෙට්‍රල් | • ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රමිතීන්ට අනුකූල ඔක්ටේන් 92 පෙට්‍රල්. | | |

**3.** පිරිසිදු කිරීමේ උපකරණ **(Cleaning Tools & Equipment)**

| අ/අ | අයිතමය | සම්මත තාක්ෂණික පිරිවිතර **(Standard Specifications)** | ලංසුකරුගේ එකඟතාවය **(Yes/No)** | ලංසුකරුගේ අදහස් |
|---|---|---|---|---|
| **17** | ඉදල් **(Ekel Brooms)** | • හොඳින් වියළුණු, ශක්තිමත් පොල් ඉරටු වලින් සකස් කර තිබිය යුතුය. අඩි 4 ක පමණ ශක්තිමත් ලී මිටක් සහිත විය යුතුය. | | |
| **18** | කොසු **(Soft Brooms)** | • කෘත්‍රිම (Nylon) හෝ ස්වභාවික කෙඳි සහිත, ගැලවී නොයන ලෙස සකස් කළ හිසක් සහ අඩි 4 ක ප්ලාස්ටික්/ලී මිටක් සහිත විය යුතුය. | | |
| **19** | මොප් **(Mops)** | • 100% කපු (Cotton) නූල් සහිත, ජලය හොඳින් උරාගන්නා හිසක් (Mop head) සහ මල නොබැඳෙන යකඩ හෝ ශක්තිමත් ඇලුමිනියම් මිටක් (අඩි 4) සහිත විය යුතුය. | | |
| **20** | වයිපර් **(Floor Wipers)** | • ඝන රබර් තලයක් (Heavy-duty rubber blade) සහිත, බිම ඇති ජලය මනාව ඉවත් කළ හැකි අඟල් 18-24 අතර පළලකින් යුත් තලයක් සහ ශක්තිමත් මිටක් තිබිය යුතුය. | | |
| **21-23** | කොමඩ් / සින්ක් / ඩෙග් බ්‍රෂ් | • කොමඩ් බ්‍රෂ්: වක්‍ර වූ නයිලෝන් කෙඳි සහිත ප්ලාස්ටික් මිට. | | |

| | | | | |
|---|---|---|---|---|
| | | • සින්ක් බ්‍රෂ්: මධ්‍යම ප්‍රමාණයේ මෘදු/රළු කෙඳි සහිත කුඩා මිට.<br><br>• ඩෙග් බ්‍රෂ් (Deck Brush): තද නයිලෝන් කෙඳි සහිත, ලී මිටක් සවි කළ හැකි ශක්තිමත් බ්‍රෂ් හිසක්. | | |
| 24 | ඩස්ටර් (Dusters) | • 100% කපු (Cotton) හෝ මයික්‍රෝෆයිබර් (Microfiber) රෙදි. ජලය සහ දූවිලි හොඳින් උරාගත යුතු අතර අවම වශයෙන් අඟල් 18x18 ප්‍රමාණයේ විය යුතුය. | | |
| 25 | හෙවි ඩියුටි ග්ලවුස් | • රසායනික ද්‍රව්‍යවලට ඔරොත්තු දෙන ඝන රබර්/නයිට්‍රයිල් (Nitrile) අත්වැසුම්. වැළමිට තෙක් දිගු විය යුතුය. | | |

පිරිසිදු කිරීමේ උපකරණ (Cleaning Tools & Equipment)

| අ/අ | අයිතමය | සම්මත තාක්ෂණික පිරිවිතර (Standard Specifications) | ලංසුකරුගේ එකඟතාවය (Yes/No) | ලංසුකරුගේ අදහස් |
|---|---|---|---|---|
| 26 | කළු ලොකු කවර | • සාමාන්‍ය අපද්‍රව්‍ය සඳහා. ඝනකම (Gauge): අවම 200. ප්‍රමාණය: අඟල් 36 x 48 කාන්දු නොවන සේ පතුල සීල් කර තිබිය යුතුය. | | |
| 27 | කළු පොඩි කවර | • සාමාන්‍ය අපද්‍රව්‍ය සඳහා. ඝනකම (Gauge): අවම 150. ප්‍රමාණය: අඟල් 18 x 24. | | |
| 28 | කහ ලොකු කවර | • සායනික අපද්‍රව්‍ය (Clinical Waste) සඳහා. ඝනකම (Gauge): අවම 300. ප්‍රමාණය: අඟල් 36 x 48. "ආසාදිත අපද්‍රව්‍ය" ලෙස මුද්‍රණය කර තිබීම අමතර සුදුසුකමකි. (LDPE ද්‍රව්‍යයෙන් නිපදවා තිබිය යුතුය). | | |
| 29 | කහ පොඩි කවර | • සායනික අපද්‍රව්‍ය සඳහා. ඝනකම (Gauge): අවම 200. ප්‍රමාණය: අඟල් 18 x 24. | | |

ලංසුකරුගේ නම :-.........................................................

ලංසුකරුගේ අත්සන ආයතනයේ නිල මුද්‍රාව :-.........................................................

- සාම්පල (Samples): ඇගයීම් කටයුතු සඳහා ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක එක් එක් අයිතමයේ නියැදියක් (Sample) නොමිලේ ලබා දීමට ලංසුකරු බැඳී සිටිය යුතුය.
- ඇසුරුම්කරණය: සියලුම රසායනික ද්‍රව්‍ය කාන්දු නොවන ලෙස ආරක්ෂිතව, අඩංගු ද්‍රව්‍යයේ නම සහ කල් ඉකුත්වන දිනය පැහැදිලිව සඳහන් කර (Properly labeled) ඇසුරුම් කර තිබිය යුතුය.

ඇමුණුම් අංක 03

<u>මහියංගණ මූලික රෝහල වෙත පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම 2026 - ප්‍රසම්පාදන අංකය -</u> **PDHS/CHEM/2026**

**ලංසු ආකෘති පත්‍රය**

**1. ලංසුකරුගේ නම :-** ..........................................................................................
..........................................................................................

**(පෞද්ගලික ව්‍යාපාරයක් නම් අයිතිකරුගේ නම සීමා සහිත පෞද්ගලික සමාගමක් නම් සමාගමේ නම)**

**2. ලිපිනය :-** ..........................................................................................

..........................................................................................

**(පෞද්ගලික ව්‍යාපාරයක් නම් අයිතිකරුගේ නම, අයිතිකරුගේ ලිපිනය සීමා සහිත පෞද්ගලික සමාගමක් නම් සමාගමේ ලිපිනය)**

**3. දුරකථන අංකය :-** ................................... **ෆැක්ස් අංකය :-**...........................
**ඊ මේල් ලිපිනය :-** ...................................

**4. ව්‍යාපාරය ලියාපදිංචි කිරිමේ අංකය හා දිනය :-** ..............................................................

**5. ආයතනයේ අයිතිකරුවෝ / අධ්‍යක්ෂ මණ්ඩලය**

| | නම | පෞද්ගලික ලිපිනය |
|---|---|---|
| I. | .............................................. | ................................................ |
| II. | .............................................. | ................................................ |
| III. | .............................................. | ................................................ |

**(මෙය ප්‍රමාණවත් නොවන්නේ නම් අදාල විස්තර වෙනත් ඇමුණුමක් මගින් ඉදිරිපත් කරන්න)**

**6. ආදායම් බදු ලිපි ගොනුවේ අංකය :-**..............................................................................

**7. වැට් බදු අංකය :-**..............................................................................

**8. යම් සේවා ලබා ගන්නා ලද ආයතනයකින් මිට පෙර ඔබේ සේවා සැපයුම අත්හිටුවා තිබේද? .....**

**මා විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් වලට අනුව මහියංගණ මූලික රෝහල වෙත ඉල්ලා ඇති පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කොන්දේසි අනුව සැපයීමට එකඟ වෙමි.**

**මා විසින් ඉහත කරන ලද ප්‍රකාශ සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි.**

.................................. ......................................

ලංසු ඉල්ලුම්කරුගේ නම අත්සන (නිල මුද්‍රාව)

ජාතික හැඳුනුම්පතේ අංකය හා නිකුත් කළ දිනය :-...........................................................

ඇමුණුම 04

01 වන පරිච්ඡේදය :

දූස්සන්ධානීය නොවන බවට වන දිවුරුම් ප්‍රකාශය (ආකෘතිය)
(අදාළ වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහා යොමුව - 1.5)

පහතින් අත්සන් කරනු ලබන ලංසුකරු හෝ නියෝජිතයා, අවංකව ද, සත්‍යවාදීව ද, ගාම්භීරතා පූර්වකව ද මෙහි දිවුරුම් දී/ප්‍රතිඥා දී සැබෑ කොට ප්‍රකාශ කර සිටින්නේ;

(අ) අදාළ ලංසු කැඳවීමේ දී කවරෙකු හෝ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සම්බන්ධයෙන් ඔහු/ඇය විසින් හෝ ඔහු/ඇය නියෝජනය කරනු ලබන ආයතනයේ,සමාගමේ ,සංස්ථාවේ හෝ හවුල්කාරිත්වයේ අන් කවර හෝ සමාජිකයෙක්, නියෝජිතයෙක් හෝ නියෝජනයකරන්නෙක් විසින් වෙනත් කවර හෝ තැනැත්තෙකු සමඟ කිසිදු සංයෝජනයකට, දූස්සන්ධානයකට හෝ ගිවිසුමකට ඇතුළත්ව නොමැති බවත්;

(ආ) ඔහු/ඇය විසින් හෝ ඔහු/ඇය නියෝජනය කරන අන් කවරෙකු හෝ විසින් ලංසු ඉදිරිපත් කිරීමෙන් කවරෙකු හො වළක්වාලීම හෝ ලංසු ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමට කවරෙකු හෝ පොළඹවාලීමට ක්‍රියාකර නොමැති බවත්;

(ඇ) මෙම ලංසුව ඉදිරිපත් කරනු ලබන්නේ අන් කවර හෝ ලංසුවකට අදාළව නොවන බවත්, එවැනි ලංසුවක් සම්බන්ධයෙන් වෙනත් තැනැත්තෙක් සමඟ වන කවර හෝ ගිවිසුමකින්, අවබෝධයකින් හෝ සංයෝගයකින් හෝ නොවන බවත්‍ය.

ඔහු/ඇය විසින් වැඩිදුරටත් ප්‍රකාශකර සිටින්නේ, මෙම ලංසුව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකුට, සමාගමකට හෝ සංස්ථාවකට සෘජුව හෝ වක්‍රව කිසිදු වට්ටමක්, ගාස්තුවක්, ත්‍යාගයක්, කොමිස් මුදලක් හෝ වටිනා දෙයක් ලැබී නොමැති බවත් නැතහොත් නොලැබෙනු ඇති බවත්‍ය.

දූස්සන්ධානීය නොවන බව සහතික කිරීමේ පූර්ණ වගකීම භාරගන්නා ලංසුකරු , සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සාධාරණ හා සදාචාරාත්මක තරඟකාරී පරිචයන්ට අනුගතව ක්‍රියාකරන බවටත්, අදාළ ප්‍රසම්පාදන මාර්ගපෝදේශවලට සම්පූර්ණයෙන්ම අනුකූලව ක්‍රියාකරන බවටත් ප්‍රතිඥා / දිවුරුම් දී සිටී.

මෙම දිවුරුම් ප්‍රකාශයේ මා විසින් කරන ලද සියලුම ප්‍රකාශයන් සත්‍ය හා නිවැරදි බවත්, අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධ දඬුවම්වලට යටත්වන බවත්, මෙයින් ප්‍රතිඥා දී / දිවුරුම් දි ප්‍රකාශ කරමි.

.............................................

දිවුරුම් ප්‍රකාශක

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය ඉහත නම් සඳහන්
ප්‍රකාශකට මා විසින් තේරුම් කරදෙන ලදුව ඔහු/ඇය
විසින් හොඳාකාරව තේරුම් ගෙන, සත්‍ය බවට
පිළිගෙන ............/......./........ වන මෙ දින
.................................................. දී
මා ඉදිරිපිට අත්සන් තබන ලදී.
සාම විනිසුරු/දිවුරුම් කොමසාරිස්

**Annexure VI of Chapter 05**
**Format for Bid Securing Declaration**
**(Relevant Reference to the Procurement Manual - 5.9 -Option – 2)**

*[If required, the **Bidder** shall fill in this form in accordance with the instructions indicatedin brackets]*
Date: ________________ *[insert date by bidder]*
Name of contract ………………………………………………………………*[insert name by PE]*
Contract Identification No……………………………………………………….. *[insert number by PE]*
Invitation for Bid No.: …………………………………………………..*[insert number by PE]*
To: **Chairmen, Procurement Committee, Department of Health Service's** Uva *[insert the name of the employer/ Purchaser preferably PE to fill before issuing the bidding document]*

We, the undersigned, declare that:
1. We understand that, according to instructions to bidders (hereinafter "the **ITB**"), bids must be supported by a bid-securing declaration;
2. We accept that we shall be suspended from being eligible for contract award in any contract where bids have been invited by any of the Procuring Entity as defined in the Procurement Guidelines published by the National Procurement Commission, for the period of three (03) years starting on the latest date set for the closing of bids of this bid, if we:
(a) Withdraw our bid during the period of the bid validity period specified; or
(b) do not accept the correction of errors in accordance with the instructions to bidders of the bidding documents; or
(c) having been notified of the acceptance of our bid by you, during the period of bid validity,
i. fail or refuse to execute the Contract Form, if required, or
ii. fail or refuse to furnish the performance security, in accordance with the **ITB.**
3**.** We understand this bid securing shall expire if we are not the successful bidder, upon the earlier of,
(i) our receipt of a copy of your notification to the Bidder that the bidder was unsuccessful; or
(ii) twenty-eight days after the expiration of our bid.
4. We understand that if we are a JV, the Bid Securing Declaration must be in the name of the JV that submits the bid. If the JV has not been legally constituted at the time of bidding, the Bid Securing Declaration shall be in the names of all future partners as named in the letter of intent.

Signed …………………………………………………………………*[Insert signature(s) of authorized representative]* In the capacity of *[Insert title]*
Name ……………………………………………………………………*[Insert printed or typed name]*
Duly authorized to sign the bid for and on behalf of……………………………………
………………………………………… *[Insert authorizing entity]*
Dated on …………………………. *[insert day]* day of *[Insert month]*, *[Insert year]*